# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 243/19—1976 දෙසැම්බර් 17 වැනි සිකුරාදා—1976.12.17

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ජනා. කා. අංකය : ඩබ්ලිව්. 68(70)/76.

### (40 වන අධිකාරය වූ) මහාජන ආරක්ෂක ආඥාපනත

අගමැතිගේ නිර්දේශය අනුව මහාජන ආරක්ෂක ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලැබූ නියෝග.

වි. ගොපල්ලව,
ජනාධිපතිවරයා.

1976 දෙසැම්බර් මස 17 වැනි දින
කොළඹ,
ජනාධිපතිවරයාගේ කාර්යාලයේ දී ය.

#### නියෝග

1. මේ නියෝග හදිසි අවසථා (ඉන්ධන පිරිමැසීමේ—දින පහේ සතිය) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 1974 ජනවාරි මස 12 වන දිනට පෙර සේවකයන්, ඔවුන්ගේ සේවා නියමයන්ට අනුකූලව, සඳුද සිට සිකුරාද තෙක්, දිනකට නියමිත පැය ගණනක් ද සෑම සෙනසුරාද දිනයක ම ඊට අඩු නියමිත පැය ගණනක් ද සේවයෙහි යොදවනු ලැබුවාවූත් ඉරිදා දිනවල වැඩ නොකළාවූත් (මෙහි මින් මතු මේ නියෝග අදාළ වන ආයතන යනුවෙන් හඳුන්වනු ලබන) සියලුම ආණ්ඩුවේ දෙපාර්තමේන්තු, සංස්ථා, පළාත් පාලන ආයතන සහ පෞද්ගලික අංශයේ ආයතන කෙරෙහි ද සියලු වෙළඳාම්, ව්‍යාපාර, කර්මාන්ත ව්‍යවසායන් හෝ ආයතන කෙරෙහි ද මේ නියෝග අදාළ වන්නේය ;

එසේ වුව ද, මේ නියෝග—

(අ) යම් කෘෂිකාර්මික නිෂ්පාදනයක් වගා කරන, සකස් කරන, නිපදවන හෝ අපනයනය කරන යම් ආයතනයකට සම්බන්ධ හෝ එකී කටයුතුවල නිරත යම් ආයතනයක් ; සහ

(ආ) යම් සාප්පුවක්

කෙරෙහි අදාළ නොවන්නේය.

එසේම, තවදුරටත්, මේ නියෝග අදාළ නොවන්නා වූ යම් ආයතනයක්, වෙළඳාමක්, ව්‍යාපාරයක්, කර්මාන්තයක් හෝ ව්‍යවසායක් හෝ ඒවායේ යම් කොටසක් මේ නියෝගවලට යටත් විය යුතු යයි හෝ මේ නියෝග අදාළ වන්නා වූ යම් ආයතනයක් හෝ එහි යම් කොටසක් මේ නියෝගවල විධිවිධානවලින් නිදහස් විය යුතු යයි නියම බලධරයා විසින් නියමයක් මගින් ප්‍රකාශ කළ හැකිය.

3. 1974 ජනවාරි මස 12 වන දින සිට හා ඉන් පසුව මේ නියෝග අදාළ වන සියලුම ආයතනයන්හි, නියම බලධරයා අන් ආකාරයෙන් විධාන කරතහොත් මිස සෙනසුරාද දිනයන් වැඩ කරන දිනයන් වශයෙන් සාමාන්‍යයෙන් නොසැලකිය යුතුය.

4. මේ නියෝග නිසා නොවේ නම් සේවකයකු විසින් සෙනසුරාද දිනවල වැඩ කළ යුතුව තිබුණු පැය ගණන, නියම බලධරයා විසින් නියමයක් මගින් විධාන කරනු ලබන ආකාරයට සඳුද සිට සිකුරාද දක්වා වූ දිනවලදී ඔහු විසින් වැඩ කළ යුතුය.

එසේ වුවද, 1974 ජනවාරි මස 12 වන දිනට පෙර එම සේවකයා වැඩ ආරම්භ කළා වූ වේලාවට කලින් වේලාවක වැඩ ආරම්භ කරන ලෙස නියම බලධරයා ඔහුට බල නොකළ යුතුය. තවද, එම සේවකයා වැඩ කළ යුතු අමතර පැය ගණන හැකි තාක් දුරට සමසේ සඳුද සිට සිකුරාද තෙක් වූ දිනවලට නිසි බලධරයා විසින් බෙදා වෙන් කළ යුතුය.

37A——ජ 24310—2,100 (76/12)

එසේම, තවදුරටත්, අතිකාල දීමනාවක ස්වභාවයේ යම් ගෙවීමක් කළ යුතු බවට යම් නීතියක්, ව්‍යවහාරයක් හෝ චාරිත්‍රයක් නැතහොත් කාර්මික ආරාවුල් පනත යටතේ යම් සාමූහික ගිවිසුමක් ඇත ද, නියම බලධරයා විසින් කරනු ලැබූ විධානයක් ඉටු කිරීමෙහිලා සඳුද සිට සිකුරාද දක්වා ඉටු කරන ලද එම අමතර පැය ගණන වෙනුවෙන් එවැනි යම් ගෙවීමක් ලැබීමට එවැනි සේවකයකුට හිමිකමක් නොතිබිය යුතුය.

5. 4 වන නියෝගය යටතේ නියම බලධරයා අන් ලෙසකින් විධාන කරනු ලැබුවහොත් මිස මේ නියෝග අදාළ වන සියලුම ආයතනවල සියලුම සේවකයන්, 1974 ජනවාරි මස 12 වන දිනට පෙර ඔවුන් වැඩ ආරම්භ කළ වේලාවට වැඩ ආරම්භ කොට, 1974 ජනවාරි මස 12 වන දිනට පෙර ඔවුන් වැඩ කළ පැය ගණනට අමතරව සඳුද සිට සිකුරාද තෙක් එක් එක් දිනය අවසානයෙහි වැඩිපුර විනාඩි හතලිස් පහක් වැඩ කළ යුතුය.

6. (1) මේ නියෝග අනුව සහ නියම බලධරයා විසින් දෙනු ලබන යම් විධාන අනුව වැඩ කිරීම වෙනුවෙන් සෑම සේවකයකුටම 1974 ජනවාරි මස 12 වන දිනට පෙර ඔහුට ලැබීමට හිමිකම් තිබුණු පාරිශ්‍රමිකයම එක් එක් සතිය සඳහා ලැබිය යුතුය.

(2) 4 වන නියෝගය අදළ වන යම් සේවකයකුට, එම නියෝගය නොතකා, සෙනසුරාද දිනයක වැඩ කරන ලෙස නියම කරනු ලැබූ හා ඒ අනුව ඔහු වැඩ කළ අවස්ථාවක, එම වැඩ කිරීම සම්බන්ධයෙන් අතිකාල ගෙවීමක ස්වභාවයේ මුදලක් ලැබීමට ඔහුට හිමිකම් ඇති අතර ඔහුට එය ගෙවනු ලැබිය යුතුය.

(3) 1974 ජනවාරි මස 12 වන දිනට පෙරාතුව ම යම් සේවායෝජකයකු විසින් යම් ව්‍යාපාරයක හෝ කාර්යාලයක සේවයෙහි නියුක්ත කරනු ලැබ සිටි සෑම සේවකයකු ම, 1974 ජනවාරි මස 12 වන දිනයට පෙර ඒ සේවකයා භුක්ති විඳිමින් සිටි වැටුප්, දීමනා සහ (කවර වූ හෝ නමකින් හඳුන්වනු ලබන) වෙනත් මුදල් ගෙවීම් පිළිබඳ වූ නියම සහ කොන්දේසිවලට අඩුවෙන් වාසිදයක නොවන කොන්දේසි පිට, වෙනත් ලිඛිත නීතිවල විධිවිධානවලට යටත්ව, තවදුරටත් ඒ සේවයෙහි එසේ නියුක්ත කරනු ලැබ සිටිය යුතුය.

7. කවර ව්‍යාපාරයක වුව ද සෑම සේවායෝජකයකුම විසින්, තමා යටතේ සේවයේ නියුක්ත සෑම සේවකයකුටම පඩිපාලක සභා ආඥාපනත යටතේ පිහිටුවන ලද යම් පඩිපාලක සභාවක යම් තීරණයක විධිවිධාන අනුව වාර්ෂික නිවාඩු දීම පිණිස ඒ සේවකයා වැඩ කළ දින ගණන ගණන් බැලීමේ කාර්යය සඳහා, එක් එක් සතියේ සෑම සෙනසුරාද දිනයක්ම එම සේවකයා වැඩ කළ දිනයක් ලෙස ගණන් ගත යුතුය.

8. 6 (3) වන නියෝගයෙහි විධිවිධාන සලසා ඇති පරිදි, වෙනත් යම් නීතියක කුමක් සඳහන් ව ඇත ද මේ නියෝග බලපැවැත්විය යුතුය.

9. මේ නියෝගවල—

" කොමසාරිස් ", " සේවක " හා " සේවායෝජක " යන පාඨවලට පඩිපාලක සභා ආඥාපනතෙහි පිළිවෙලින් දී ඇති අර්ථ ම ඇත්තේය ;

" නියම බලධරයා " යන්නෙන්—

(අ) ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක් හෝ සංස්ථාවක් සම්බන්ධයෙන් වූ විට, එම ආණ්ඩුවේ දෙපාර්තමේන්තුව හෝ සංස්ථාව භාර අමාත්‍යාංශයෙහි ලේකම් ;

(ආ) යම් පළාත් පාලන ආයතනයක් සම්බන්ධයෙන් වූ විට රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් ;

(ඇ) පෞද්ගලික අංශයේ යම් ආයතනයක් සම්බන්ධයෙන් වූ විට, කම්කරු කොමසාරිස්වරයා හෝ යම් නියෝජ්‍ය හෝ සහකාර කම්කරු කොමසාරිස්වරයෙක්

අදහස් වේ ;

" පළාත් පාලන ආයතනය " යන්නෙන් යම් මහා නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වේ ;

" පෞද්ගලික අංශයේ ආයතනය " යන්නට යම් කාර්යාලයක් ඇතුළත් වේ ;

" සංස්ථාව " යන්නෙන් ප්‍රාග්ධනය සම්පූර්ණයෙන්ම හෝ එහි යම් කොටසක් හෝ ආණ්ඩුව විසින් සපයන ලද සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ යම් පුද්ගල මණ්ඩලයක් අදහස් වේ ;

" සාප්පුව " හා " කාර්යාලය " යන පාඨවලට (129 වන අධිකාරය වූ) සාප්පු හා කාර්යාල සේවකයන් පිළිබඳ (සේවය හා පඩිනඩි විධිමත් කිරීමේ) පනතෙහි පිළිවෙලින් දී ඇති අර්ථම ඇත්තේය. එහෙත් නියම බලධරයා විසින් මෙම නියෝගවල විධිවිධානවලින් නිදහස් කරනු ලබන වෙන යම් කාර්යාලයක් එම පාඨවලට ඇතුළත් නොවන්නේය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.